# <u>කාර්ය පත්‍රිකාව.</u>

01. පන්තිය:- 6 ශ්‍රේණිය විෂය:- පෙරදිග සංගීතය. අදාල සතිය:- ......................................

(මාසය / සතිය)

02. පාඩම හෝ ඒකකය:- 4.1 - සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි
(මාතෘකාවක් මත කරන නිර්මාණ - මේවර කෙළිය)

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගැනුම් ඵල.

- සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.
- මේවර කෙළියේ ගීත ගායනා කරයි.
- රංගනයේ යෙදෙමින් රසාස්වාදය යෙදේ.
- ගැමි පරිසරය , ගැමි ජීවන රටාව මෙම ගීත තුලින් විචිත්‍රවත්ව මැවී පෙනෙන බව ප්‍රකාශ කරයි.
- මේවර කෙළියේ ස්වභාවය විස්තර කරයි.

04. ශිෂ්‍යයා කළයුතු කාර්යයන් කෙටියෙන්: -

- දේශීය ජන ක්‍රීඩා හා බැඳි සාම්ප්‍රදායික ගායන විශේෂයන් පිළිබඳ තොරතුරු ගවේෂණය .
- එම ජන ක්‍රීඩා අතුරින් ‘‘මේවර කෙළිය’’ පිලිබඳ අවබෝධයක් ලබාගැනීම. (පොත් පත්, සහරා පරිශීලනය තුලින්)
- ‘‘මේවර කෙළිය’’ පිළිබඳ සඳහන් You tube වීඩියෝ නැරඹීම මගින් ඒ පිලිබඳ වැඩිදුර අවබෝධයක් ලබාගැනීම.
- ප්‍රශ්න හා පිළිතුරු වශයෙන් ඇති ගායන හා රංගන ක්‍රියාකාරකම් පිලිබඳ අවබෝධයක් ලබාගැනීම
- ඒ තුලින් ගම්‍ය වන මේවර කෙළිය ආශ්‍රිත වස්තු බීජය හා කතා සන්ධර්භය අවබෝධ කර ගැනීම (නැතිවී ඇති කාන්තා ආභරණයක් සොයනා බව)
- සෙවීමක්, විමසීමක්, හා එයට පිළිතුරු දීමක් මෙම ජන ක්‍රීඩාවෙන් සිදු වන බව වටහා ගැනීම
- මෙය සාමූහික ක්‍රියාකාරකමක් බවත්, ඒ තුලින් එකමුතුකම, සහජීවනය , සුහදතාවය වර්ධනය කරන ගීත විශේෂයක් බව අවබෝධයක් කරගැනීම.
- මේවර කෙළි ගීත අසා රසවිඳ, ඒවා ගායනය.
- ගැමි පරිසරයේ පවතින විචිත්‍රවත් බව අවබෝධ කරගැනීම.
- මෙය කාන්තාවන් ගේ ක්‍රීඩාවක් බවත්, එම නිසා එහි කාන්තාවන් පමණක් රංගනයේ යෙදෙන බවත් වටහා ගැනීම.
- දෙබස්වල රිද්මයානුකුල බව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

05. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, web site , LMS පාඩම් , වෙනත් ආධාරක (on line/ off line/ printed)

ආධාරක

- e නැණ පියස - 6 ශ්‍රේණිය, පෙරදිග සංගීතය
- හෙළ ජන වංශය - මුහුණු පොතෙහි සිංහල ජන ක්‍රීඩා.
- එකමුතුකම හා බැඳෙන ජන කෙළිය..... මහා වංශය.
- ජන ක්‍රීඩා 1- 2 (FOS media) student’s blog
- අපේ ජන ක්‍රීඩා තෙලිතුඩ.
- එළිමහන් ජන ක්‍රීඩා

**අතිරේක පොත් / සඟරා**

- 6 ශ්‍රේණිය, පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත;{ පිටු අංක 43 – 44}
- විශාරද විජයබණ්ඩාර සමරවීර මහතාගේ 6 ශ්‍රේණිය, සංගීතය පොත; {පිටු අංක 87 – 88}

06. ඇගයීම / තක්සේරු කරණය:-

A. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (හරි - √) ලකුණද , වැරදි නම් (වැරදි ලකුණ - x ) ද යොදන්න.
   i. ගෘහස්තව කෙරෙන ක්‍රීඩාවකි ( )
   ii. නැති වූ ආභරණය , සොයාගත් පසු මෙම ක්‍රීඩාව කරනු ලැබේ. ( )
   iii. සාමූහිකත්වය වර්ධනය කෙරෙන සිංහල ජන ක්‍රීඩාවක් ලෙස මේවරකෙලිය හැඳින්වේ.( )
   iv. කාන්තාවන් පමණක් නියෝජනය වන ක්‍රීඩාවකි. ( )
   v. ප්‍රශ්න හා පිළිතුරු වශයෙන් රංගනය හා බැඳි කෙලි ගීත විශේෂයකි. ( )

B. පහත දැක්වෙන ගී පද සම්පූර්ණ කරන්න
   I. කහවතු ........................................................................................................
      වල.............................................................................................................
   II. මුං වතු කන්දේ ...............................................................................................
      වල ............................................................................................................
   III. මිදුල වටේ ....................................................................................................

C. මේවර කෙළිය රංගනය සඳහා යොදාගත හැක සංගීත භාණ්ඩ නම් කරන්න

D. මේවර කෙළිය ක්‍රීඩාව කරන ආකාරය චිත්‍රයකට නගන්න

**නිලධාරියාගේ නම :-** එම් . ජී. එස්. ගුණවර්ධන.

**පාසල: -** කෑ/මාව අශෝක ජාතික පාසල.